හැකිය. මේ කටයුත්ත කළේ නම් අනිවාර්යෙන්ම එය සිදුවනු ඇත. ඒ කටයුත්ත සිදු කරන අතර ඔබට ශරීරය තුළ ඇති වෙන ඒ සකස්වීම නැවැත්වීමට හැකියාවක් තිබේද? නොහැකිය. ඔබම මෙය සිදුකර අවබෝධය ලබාගන්න. මින් පැහැදිලි වන්නේ කයෙහි සිදුවන සකස්වීම්වලටද මට අයිතියක් නොමැති බවය.
සිතේ සිදුවන සකස්වීම මීට වැඩිය බොහෝ වේගවත්ය. එය කොතෙක්ද යත් නිදහසේ පාරක තොටක යාමටවත් අපට ඉඩක් නොමැත. මේ සිතත් සමඟ අපගේ ගමන දෙබර කූඩයක් අරගෙන පාරේ යාමක් බඳුය. දෙබර කූඩයක් අරගෙන පාරේ යන්නට ගියොත් කවර තත්ත්වයක් ඇතිවේද?
නිරන්තරයෙන්ම දෙබරු ඇවිස්සෙමින් එය ගෙන යන්නාවද, අවට සිටින්නන්ද දුකට පත්කරයි. අපට පාලනය කළ නොහැකි ඇස කණ නාසය දිව ශරීරය සමඟ අපි පාරේ ගමන් කරන විට අපිට දැරීමට නොහැකි තරම් ගින්දර සිතේ සකස් වේ. නොබලා සිටිය නොහැකි රූප පාර දෙපස එමටය. නොඇසා සිටිය නොහැකි ශබ්ද පාර දෙපස එමටය. නොවිඳ සිටිය නොහැකි ගඳ සුවඳද පාර දෙපස එමටය.

බොහෝ ප්‍රිය ජනක අයෙකු සමඟ අල්ලාප සල්ලාපයෙන් යුතුව පාරේ ගමන් කරමින් සිටින ප්‍රීතිමත් අවස්ථාවක පරණ තරහකාරයෙකු ඇස ගැටුණහොත් ඇසිපිය හෙළන වේගයටත් වැඩි වේගයකින් සිත තුළ තරහක් සකස් වේ. ඒහාම එතෙක් පැවැති චිත්තප්‍රීතිය වසාගෙන ඇතුළතින් දැවිල්ලක් ඇතිවේ. සුඛෝපභෝගී වාහනයක වීදුරුද



වසාගෙන ගමන් කරන තැනැත්තන් තුළ පාරේ ගමන් කරන අන් අය කරන වැරදි දකින විට ඇතිවන ගින්දර වැනි හැඟීම වාහනයේ වායු සමීකරණයෙන් ලැබෙන සිසිලස පරදා පුද්ගලයාව දැවිල්ලට පත් කරන අවස්ථා කොතෙක් වේද ? පාරේ වැරැද්ද කරන්නේ වෙන අයෙකි. ගින්දර සකස්වන්නේ අප තුළය. කුමක් කරන්නද? සිතේ සකස්වීමේ ස්වාභාවය එසේය. අපට අවශ්‍ය ආකාරයෙන් පැවැත්වීමට හෝ නැවැත්වීමට නොහැකිය.

අපි නිස්කලංකව නිවෙසේ කටයුත්තක යෙදී සිටින අවස්ථාවක යමෙක් අලුත් ආරංචියක් ගෙන එයි. එයින් කියැවෙන්නේ අපි ඉතා හොඳින් දන්නා හඳුනන පවුලක දරුවෙක් නිවෙසින් රහසින් පලාගොස් හිතුමතේ විවාහයක් කරගෙන ඇති බවය. මේ ආරංචිය ඇසූ තැන් පටන් අපට එය තවත් කෙනෙකුට කියන තෙක් ඉවසිල්ලක් නැති ස්වාභාවයක් ඇතිවෙයි. දුරකථන ඇමැතුමක් අරගෙන හෝ එය තවත් කෙනෙකුට කියයි. එසේ නොඉවසිලි තත්ත්වයක් ඇතිවීම යනු සිතේ තවත් සකස්වීමකි. ඒ අනුන්ගේ දේවල් පිළිබඳ කතාබහේ යෙදෙන්නට අප තුළ ඇතිවන ඇල්ම හෙවත් සම්ප්‍රප්ප්‍රලාපයෙහි ඇති කැමැත්තය. එහෙත් එය ඒ ආකාරයෙන් අපිට නොතේරේ.

පාරේ යනවිට ඇස කණ නාසය දිව ශරීරය යන ආයතන ක්‍රියාකාරීත්වයෙන් අප තුළ විවිධාකාරයේ සිත් සකස් වේ. එය නවත්වා ගැනීමට හැකියාවක් අපට නැත. සැඩ පහරක් ඔස්සේ ගසාගෙන යන්නාක් මෙන් අපි සියලු දෙනා ගමන් කරන්නේ එබැවිනි. සකස් වෙනවිට දරාගෙන සිටීමට නොහැකිය. ඔබව කිසිවෙක් තල්ලු කරන අවස්ථාවක ඔබට විසි නොවී සිටීමට හැකියාවක් ලැබෙන්නේ තල්ලු කරන පුද්ගලයා දුර්වලයෙකු නම් පමණකි. තල්ලු කරන්නා ඔබට වඩා ශක්තිමත් අයෙකු නම් ඒ තල්ලුව ඔබට දරාගෙන සිටීමට නොහැකිය. ඔබ විසිවී යයි. ඒ මදිවට තල්ලු කරන පුද්ගලයා එය කරන්නේ ගිනියම් වූ යකඩයක් ඔබේ ඇඟ මත තබා නම් එය ඉවසීමට ඔබට හැකියාවක් තිබේද?

අම්මෙකුට තාත්තෙකුට දුර බැහැර සිටිනා දරුවෙකු සිහිපත්වූවිට දරුවා දකින්නට සිත ඇතුළාන්ත තල්ලුවක් එයි. නොගියොත් ඇතුළාන්තය දවන ගින්නක් ඇතිවේ. එවිට දුක් වේදනා ඇතිවේ. ශෝක පරිදේව දුක්ඛ දෝමනස්ස යැයි අපි ඒවාට කියමු. දකින්න ඕනෑ යැයි සිතුණු ගමන් අපි ඒ ඒ අය දකින්නට ගොස් ගින්න නිවාගන්නෙමු. එහෙත් පසුදා නැවතත් ඒ ගින්න හටගනී. අප එය නිවාගන්නට නැවතත් ප්‍රියයා දකින්නට යන්නෙමු. අපි ගිනි නිවාගන්නේ මේ ආකාරයෙනි. මේ ආකාරයෙන් ගිනි නිවාගැනීම තාවකාලිකය. නැවත නැවතත් ගින්න හටගනී. මේ ගින්න නිවා ගන්නට බුදුහාමුදුරුවෝ දේශනා කරන පිළිවෙත අප අනුගමනය කරන පිළිවෙතට හාත්පසින්ම වෙනස්වූ අනෙකකි.

බොහෝ දෙනෙක් කතා කරන දැඩි උනන්දුවක්ද දක්වන 'ආදරය' යන්නද සිතේ ඇතිවන සකස්වීමකි. එහෙත් අපි එයට දී ඇති අර්ථ දැක්වීම කුමක්ද? 'සදා නොවෙනස් ආදරේ' යැයි යමෙකු කියයි. ඔබ සදා නොවෙනස් ආකාරයේ ආදරයක් දක්වන අයෙකු පිළිබඳවම ඇතැම් අවස්ථාවක 'නැති එකමයි හොඳ මළ වදේ' යැයි සිතෙන අවස්ථාද තිබෙනවා නොවේද? මේ දෙකම හටගන්නේ එකම සිතෙහිය. ඊට හේතුවන්නේ විවිධ කරුණුය. එසේ නම් සදා නොවෙනස් කියූ ආදරය සදා නොවෙනස්ද?
සර්ව සම්පූර්ණයෙන්ම එක සමාන පුවක් ගෙඩි දෙකක් සොයා ගැනීමට අපිට හැකිද? එය ලෙහෙසි පහසු කටයුත්තක් වන්නේ නැත. ගෙඩියක් ගෙඩියක් පාසා මතුපිටින් බැලූ බැල්මට පෙනෙන සමානකම මෙන්ම කුමන හෝ වෙනස්කමක්ද තිබෙන බැවිනි. රූප ධර්මතාවල ස්වාභාවය එසේ නම් ඊට වඩා වේගයෙන් වෙනස්වන සිතේ එකම දෙයක් කෙරෙහි එක සමාන සිත් දෙකක් ඇතිවේ යැයි සිතන්නේද? කෙනෙකුට තවත් කෙනෙකු පිළිබඳ එක් මොහොතක ඇතිවන හැඟීම ඊළඟ මොහොතේ ඇතිවෙන්නේ ඊට වඩා වෙනස්වය. ඊළඟ මොහොතේ තවත් වෙනස්ය. එක්වරයක් ඇතිවුණු සදා නොවෙනස් ආදරේ තවත් වරක් ඒ ආකාරයෙන්ම ඇතිවීමක් සිදුවන්නේම නැත. කුමන හෝ වෙනසක් තිබේ.

සකස්වීම් හෙවත් සංස්කාරද අපට අයිති දෙයක් නොවන බව දැන් පැහැදිලි විය යුතුය.


# IMMIGRATION LAW @
Australian Immigration Law firm of the Sri Lankan Community

We are proud to have lead the way for others to follow...

**Professional Immigration Legal Services**
Legal Advice in simple to complex Immigration matters

- Skill Assessments
- State Sponsorships Expression of Interest (EOI)
- Visa Lodgments
- Employer Sponsorships & Nominations
- Migration Review Tribunal Appeals
- Federal Court Appeals
- Ministerial Appeals

General Skill Migration
457 Visas
Employer Nominated Migration
Student Visas
Graduate Skill Visas
Permanent Residence Pathways
Spouse Visas
Contributory Parent Visas
Business Migration
Resident Return Visas

A Team of Qualified & Experienced Lawyers & Registered Migration Agents



**Susantha Katugampala**
Principal
Barrister & Solicitor
Accredited Immigration Law Specialist
MARN: 9601070

LAW INSTITUTE OF VICTORIA ACCREDITED SPECIALIST

FAIRFIELDS LAWYERS
10 Morrison Place
East Melbourne 3002
Australia
T: 03 9650 4557
1300 888 331
M: 0417 851 041

AUSTRALIA GATEWAY
Australian Immigration Law Advisory
Suite 602, Hilton Colombo
Residence 200
Union Place, Colombo 2
Sri Lanka
T: +94 11 2300 627
M:+94 777 347 670

info@fairfieldslawyers.com



*We Deliver Results...*